SC

# ආදි බෞද්ධ චින්තනයෙන් සහ ප්ලතෝනික දර්ශනයෙන් පිළිබිඹු වන දේශපාලන සංකල්ප පිළිබඳ අධ්‍යයනයක්

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ
දර්ශනය පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධිය සඳහා
ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධය

2007 දෙසැම්බර්

එම්. ඒ. සී. මුණසිංහ.
ශිෂ්‍ය අංකය: FGS/P/MSSC/2003/02.

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 509 |
| වර්ග අංකය | |

විද්‍යාලය (ශ්‍රී ලංකාව)

## සාරාංශය

අධ්‍යාත්මික විමුක්තියක් සඳහා මඟ පෙන්වන බුදුදහමෙහි ප්‍රාථමික වශයෙන් අන්තර්ගත රාජ්‍ය පාලනය හා සම්බන්ධ කරුණු හුදෙක් එබඳු විමුක්තියක් අපේක්ෂා නොකරණ ග්‍රීක දර්ශනයෙහි ප්‍රකට චින්තාවන් ඉදිරිපත් කළ ප්ලේටෝගේ ඉගැන්වීම් ඇසුරින් මතුවන දේශපාලන අදහස් සමඟ කොතෙක් දුරට සමාන වන්නේ ද නොඑසේ නම් විෂමතාවන් පවතී ද ඒවායේ අරමුණු හා ස්වභාවය කෙබඳු ද යන ගැටලුවලට අධ්‍යයනයන්ට අනුගතව නිගමනයකට පැමිණීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ.

අදාළ ප්‍රාථමික, ද්විතීක මූලාශ්‍ර පාදක කර ගනිමින් දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම, සහ ක්‍රමානුකූලව උපන්‍යාස සත්‍යෝක්ෂණය කිරීම සඳහා ඒවා සංවිධානය කිරීම මෙහිදී සිදු කරන ලදී.

පෙරදිග, අපරදිග දේශපාලන චින්තනයන්හි දේශපාලන ක්‍රමවේද වෙනස් වුව ද අරමුණ එකකි. එහෙත් මෙම දේශපාලන ක්‍රමවේද භාරතයේ පහළ වූ බුදුදහමෙහි දුලභ වශයෙන් හමුවේ. අපරදිග දේශපාලන ඉතිහාසයෙහි මූලිකයා ලෙස සළකන ප්ලේටෝගේ දේශපාලන සංකල්ප බටහිර දේශපාලන විද්‍යාවේ මූලිකාංග වශයෙන් භාවිත වේ. න්‍යායාත්මකව හා ප්‍රායෝගිකව බෞද්ධ, ප්ලතෝනික දේශපාලන සංකල්පයන්හි සමාන, අසමානතා දක්නට ලැබේ.

ලොව ප්‍රාථමික සමාජයන්හි සිට දියුණු උසස් සමාජයන් දක්වා දේශපාලනික වශයෙන් සංවිධානය වීම දක්නට ලැබෙන අතර මේවාහි මූලික අරමුණ හා වගකීම් පිළිබඳ විවිධත්වයන් මෙන් ම ගැටීම් ඇතිවන අවස්ථාවන් ද දක්නට ලැබේ. මෙම ගැටීම් අවම කර පාලක හා පාලිත වගකීම් සුරක්ෂිත කර ජීව-අජීව පරිසරය සමතුලිත කිරීම පිණිස දේශපාලන මූලධර්මයන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ගැටලු සහිතය. මෙයට විසඳුමක් බටහිර හා පෙරදිග

චින්තකයින් දෙදෙනෙකුගේ දේශපාලනික ඉගැන්වීම් ඇසුරින් ඉදිරිපත් කරයි. බෞද්ධ දේශපාලන චින්තනයෙහි මූලික පදනම "ධර්ම" සංකල්පයෙන් විග්‍රහ වන අතර ප්ලතෝනික චින්තනයෙහි එය "යහපත" යන සංකල්පයෙන් විග්‍රහ වෙයි. මෙම පරමාදර්ශයන් ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාවත් ආගමික හෝ දාර්ශනික පසුබිමක මෙම සංකල්ප ප්‍රභවය වුව ද එහි කැපී පෙනෙන වෙනසක් නොමැති බවත් නිගමනය කෙරේ.